• ඔන්න අපි මේ pdf එකෙන් කතා කරනවා මාතෘකා කීපයක් ගැන. කිසිම මාතෘකාවක් skip කරන්නෙ නැතුව හොඳට බලන්න. මොකද ඔයාල කිසිම අඩු පාඩුවක් නැතුව මේ දේවල් ඉගෙනගන්න ඕනේ.

1) AMD
2)Sessions and kill zone
3)Turtle soup
4)Candle Range Theory(CRT)
5)Change in state of delivery(CISD)

ඉතින් අපි දැන් යමු මේ මාතෘකා ගැන කතා කරන්න. මම මේ මාතෘකා එකින් එක අරගෙන ඔයාලට පැහැදිලි කරල දෙන්නම් උදාහරණත් එක්කම.හොඳට අවධානෙන් ඉගෙනගන්න. ඔයාලටත් අවශ්‍යයි වගේනම් note එකක් දාගන්න. ඔයාලගෙ දැනුම උපරිම වැඩි කරගන්න.


# 1) AMD

•Crypto,forex කියන market දෙකම හැසිරෙන විදියක් තියෙනව. අපි ඒක කොටස් තුනකට බෙදල තියෙනව. අන්න ඒකට අපි Power Of Three කියල කියනවා.

1) ACCUMILATION
2) MANIPULATION
3) DISTRIBUTION


•ගොඩක් වෙලාවට මේ කියන විදි තුනට තමයි Market එක run වෙන්නේ.

•මුලින්ම market එක price level දෙකක් අතරෙ run වෙනවා. සරලව කිව්වොත් sideway එකක් යනවා. ඊට පස්සෙ up side එකට හෝ down side එකට run වෙන්න ගන්නවා liquidity ගන්න. ඊට පස්සෙ තුන් වෙනියට වෙන්නෙ market එක free එකේ run වෙන එක.දැන් අපි බලමු උදාහරණ.





මේ තමයි සරලම බලාගන්න පහසුම උදාහරණය ඔයාලට. මෙන්න මේක තමයි මම පැහැදිලි කරල දුන්නෙ කොහොමද වෙන්නෙ කියලා.එතකොට අපි දැන් බලමු candle stick chart වල කොහොමද මේක වෙන්නෙ කියලා.මතක තියාගන්න buy සහ sell කියන sides දෙකටම මේක වෙනවා. මම ඔයාලට පැහැදිලිව බලාගන්න ඕනෙ නිසා සහ කියල දෙන්න ඕනෙ නිසයි line chart එකෙන් මේක පෙන්නුවෙ sell side එකට. දැන් බලමු sides දෙකටම.

•Sell side



•Buy side



## 2)Sessions And Kill Zones

•විවිද රටවල් වල market එක වැඩ කරන වෙලාවල් තමයි අපි sessions කියලා හඳුන්වන්නේ.
• Sessions start වෙනව කියල කියන්නෙ රටවල් වල banks open කරන time එකට. Banks open වෙනකොට session එකත් open වෙනවා.
•මේ වෙලාවල් ඇතුලෙ අපිට වැදගත්ම වෙන දේ තමයි kill zone කියල කියන්නේ.
•මේ kill zones බලනකොට අපි use කරන්නෙ NY වෙලාවන්. ඒ කිව්වෙ New York වෙලාවල්.
•මෙතනදි අපි kill zones විදියට use කරන්නෙ Asian Range එක,London session Open එක,New York session open එක.

•ඔන්න ඕවට තමයි අපි කියන්නෙ kill zones කියලා. දැන් බලමු කොහොමද මේ

වෙලාවල් තියෙන්නෙ කියලා. මන් කලින් කිව්වනේ මේ kill zones අපි බලන්නෙ New York වෙලාවල් වලින් කියලා.ඒක නිසා මන් පහලින් දාන්නම් kill zones ටික.


| | |
|---|---|
| Mid Night Open | 00.00 |
| London Open | 02.00-05.00 |
| New York Open | 07.00-10.00 |
| Asian Range | 20.00-00.00 |

•අපි කලින් කතා කරානෙ AMD ගැන. ඒ කිව්වෙ power of three. දැන් බලමුකො මේ kill zones වලට POWER OF THREE කියන එක apply කරල.

>ACCUMILATION:- ASIAN RANGE
>MANIPULATION:- LONDON OPEN
>DISTRIBUTION :- NEW YORK OPEN

•මෙන්න මේ විදියට වෙන්න වැඩි සම්භාවිතාවක් තියෙනවා Market එක.

•දැන් මම උදාහරණයක් පෙන්නන්නම් කොහොමද මේක වැඩ කරන්නෙ කියල market එකේ. ගොඩක් වෙලාවට market එක මෙහෙම වෙනවා. හැම වෙලේම වෙන්නෙ නෑ. ඔයාල හරියට බලල analays කරල තමයි entries ගන්න ඕනෙ. හැම වෙලේම මේ POWER OF THREE විශ්වාස කරගෙන නිකන්ම entries ගන්න එපා.





Trades වලට enter වෙනකොට ගොඩක්ම අපි use කරන්නෙ LONDON සහ NEW YORK කියන zones. ASIAN zone එක භාවිතා වෙන ප්‍රමානය ගොඩක්ම අඩුයි.

## 3) TURTLE SOUP

•අපි කලින් කතා කරපු POWER OF THREE,එහෙම නැත්තන් AMD වලදි ඉගෙනගත්ත manipulation එකේ තමයි අපිට මේ TURTLE SOUP එක බලාගන්න පුලුවන් වෙන්නේ.


•HIGH එකක් හෝ LOW එකක් candle එකක wick එකකින් break කරාට පස්සෙ තමයි අපි TURTLE SOUP එකක් කියල ඒක නම් කරන්නේ.



## 4) CANDLE RANGE THEORY(CRT)


•Candle එකක high එක හරි low එක හරි ඊලඟට හැදෙන candle එකේ wick එකෙන් break කරල ඊට විරුද්ද දිශාවට market එක run වෙනවනම් අපි ඒකට CRT එකක් කියල කියනවා.

•Candle එකක High එක හරි low එක හරි candle එකේ wick එකෙන් break කරල close උනාට පස්සෙ අපිට ඒක අඳුරගන්න පුලුවන් වෙනවා.



• High එක හරි low එක හරි wick එකෙන් break කරල close උනාට පස්සෙ අපිට entries ගන්න පුලුවන්.
•ඒකට තව confirmation ඕනෙ වෙනවා.ඒව අපි ඉස්සරහට බලමු.
•මේකෙදි TP තියනකොට candle එකෙන් 50%ක් වගේ තියාගන්න පුලුවන්.

Example👇



## 5) CHANGE IN STATE OF DELIVERY(CISD)

•Liquidity ගැනීමේදී අවසානෙට හැදෙන strong ම candle එක,එහෙම නැත්තන් powerfull ම candle එක අපිට CISD Candle එක විදියට ගන්න පුලුවන් අපිට.

•එක එක traders ල විවිද මත දරනවා. ඒක එයාල ඉගෙනගෙන තියෙන විදිය නිසා.

•Liquidity ගන්නකොට අවසානෙට හැදෙන buy candle කීපය හරි sell candle කීපය හරි ගන්න වෙලාවලුත් තියෙනවා.නැත්තන් අවසාන candle එක විතරක් ගන්න අයත් ඉන්නවා.

•මෙතනදි අපිට market එක කලින් move වෙලා තියෙන විදිය සහ අපිට ගන්න පුලුවන් risk එක අනුව ආකාර දෙකටම CISD ගන්න පුලුවන් වෙනවා.

1)




2)



ඉතින් ඔන්න ඔහොම තමයි CISD අපිට අඳුරගන්න පුළුවන් වෙන්නේ.

මම හිතනවා ඔයාල මේ pdf එකෙන් හොඳ දැනුමක් ගන්න ඇති කියලා. මොකද මට පුළුවන් උපරිම විදියට මම සරලව ඔයාලට මේ දේවල් කියල දුන්නේ. ඉතින් තවත් ප්‍රශ්න තියෙන්න විදියක් නම් නෑ.තවත් විස්තර දැනගන්න ඕනෙනම් මේකට අදාල video එක බලල ඉගෙනගන්න.

එහෙනම් guys ඊලඟ pdf එකෙන් හම්බෙමු. හැමෝටම ජය වේවා...

All rights reserved©.
ORGA AUKLAND (PVT) LTD